

ආචාර්ය
**පාලිත ගනේවත්ත**

සාහිත්‍ය සම්භාෂණ 7

# උමංදාව

මියුලු නුවර වේදේහ රජු වැනි කපටි ආත්මාත්කාමි රජකුට අර්ථයෙන්, ධර්මයෙන්, අනුශාසනා කරන්ට වූ මහෞෂධ පණ්ඩිතයාට මුහුණපාන්නට වූ අතවර, මෙකල දේශපාලනඥයකුට මුහණ පාන්නට සිදුවන අතුරු අන්තරාවලට අසමාන නොවේ.

**සිංහල ජාතක** පොත පැරණි සිංහල ජනතාවගේ හදින් නැගුණු අධ්‍යාත්ම ගීතයක් මෙන් ඔවුන්ගේ සිතුම් පැතුම් අදහස් උදහස් ඔවුන් විඳි දුක් වේදනා අව්‍යාජව හෙළි කරන කතා සංග්‍රහයක් බව සාහිත්‍ය සම්භාෂණ ආරම්භයේදීම අපි සඳහන් කළෙමු. වස්තු සන්දර්භය හා විකාශණය අතින් බොහෝ ජාතක කතා වර්තමාන දියුණු කෙටි කතාවට බෙහෙවින් සමාන වෙයි. මේ අනුව පෙනී යන්නේ බෞද්ධ ජාතික කතා ලොව පහළවූ ශ්‍රේෂ්ඨතම කතා ගණයට අයත් වන බවයි. පන්සිය පනස් ජාතික පොතේ කතා දහයක් පමණ නවකතා ලෙස සැලකිය හැකි තරම් ප්‍රමාණයෙන් විශාලය.

මේ අතරින් සිංහලයන් අතර වඩාත්ම ප්‍රකට වූයේ උමංදාව නමින් හැඳින්වන උම්මග්ග ජාතකයයි. එම කතාවට 'උම්මග්ග' යන නම ලැබී ඇත්තේ 'උමගේ කතාව' එම ජාතක කතාවට ඇතුළත් වී ඇති බැවිනි. උමංදාවෙන් හෙළිවන්නේ බෝසතුන් 'මහෞෂධ' පණ්ඩිතයන් ඉපදී ගත කළ ජිවිත කාලයේදී තම නැණ මහිමයෙන් මහ රජතුමන් රට වැසියමුත් විවිධ අවදානමට ගොදුරු වූ අවස්ථාවල දී බේරාගත් අන්දමයි. අප මහ බෝසතුන් ගේ වීරත්වයන් ප්‍රඥා මහිමයෙන් උමංදාවෙන් හෙළිවෙයි.

උමංදාව අයත් වන්නේ පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථාවලියේ උපහාස කතා වංශයටයි. පෙර කල රජුන් හා ඔවුන් අනුශාසන කළ බමුණු පඬිවරුන් කර්කශ උපහාසයට හසුකරන කතා උමංදාවෙහි බහුලය. උමංදාවෙහි භාෂා විලාසයද වර්තමාන භාෂා විලාශයට බෙහෙවින් සමානය. එහි දෙමල වචන ද බහුලවීම උමංදාව ලියූ අවධියේ දෙමළ භාෂාවේ බලපෑම තදින් පැමිණි බවට සාක්ෂියකි. උමංදාව ගැන විවරණයක් කරන හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් මෙසේ සඳහන් කර ඇත.

''උමංදාව වූ කලී වස්තු ලෝභය, ස්ථාන ලෝභය, කිත්යසස් ලෝභය කුමන්ත්‍රණය යන ආදියෙන පරිපීඩිත ජනයාගෙන් යුතු, වර්තමාන සමාජයට අසමාන නොවන සමාජයක තතු ඇති සැටියෙන් නිරූපණය කරන රචනාවකි. ඒ රචනාවෙන් නිරූපිත පරිසරයද, ඒ පරිසරයට හසුව අධමස්ථානයෙහි වැටුණවුන් ගේත් , ශ්‍රේෂ්ඨ ස්ථානයට නැගුණවූන් චරිතද උගැන්මෙන්, මෙකලට උචිත ව්‍යවහාර ඥානයක් ලැබිය හැකිය. ජාතීයක් වශයෙන් සිංහලයන් පැසුණු අවධියෙහි ඔවුන්ගේ සමාජයත්, සංස්කෘතියත් නිරූපණය කෙරෙන ගද්‍යයක් ලෙස සැලකිය යුතු උමංදාව වර්තමාන අවධියෙහි අපේ විශේෂ සැලකිල්ලට භාජනය විය යුත්තකි. (සිංහල සාහිත්‍යයේ නැගිම 122 - 123 පිට, 12 වන මුද්‍රණය.

මියුලු නුවර වේදේහ රජු වැනි කපටි ආත්මාත්කාමි රජකුට අර්ථයෙන්, ධර්මයෙන්, අනුශාසනා කරන්ට වූ මහෞෂධ පණ්ඩිතයාට මුහුණපාන්නට වූ අතවර, මෙකල දේශපාලනඥයකුට මුහණ පාන්නට සිදුවන අතුරු අන්තරාවලට අසමාන නොවේ. මහෞෂධ පණ්ඩිතයන් කුඩා අවදියේදී තමන් විමසනු පිණිස වේදේහ රජු විසින් ඉදිරිපත් කළ සෑම ප්‍රශ්නයක්ම විසඳමි. මියුලු නුවර සතුරන් විසින් වට කරන ලද අවස්ථාවේදී එනුවර තම ප්‍රඥා මහිමයෙන් බේරා ගනියි. වේදේහ රජුගේ පැරණි පුරෝහිතයා වූ කේවට්ටයාගේ නිකටෙන් ලේ ගලන තෙක් ඔහුගේ හොම්බ බිම උලවයි. තමාත් තම රට හා රජතුමාත් විනාශ කරනු පිණිස සතුරන් අටවන ලද භයානක කුමන්ත්‍රණයක් අසාර්ථක කර දමා රජතුමාත් රජ පවුලේ සියළු දෙනාත් බේරා ගනියි. මේ කිසි අවස්ථාවකදී මහෞෂධ පණ්ඩිතයන් සතුරු බල මැඩ ජයගත්තේ ලේ බිඳකුදු නොසෙලවීමෙනි. ප්‍රඥා මහිමයට, නුවණැසේ බලයට සියල්ල පරාජය වන බව කදිමට පෙන්වා දෙන එකම සිංහල කථාන්තරය උමංදාව බව නොවලහා කිව හැකිය.

උමංදාවෙහි ප්‍රධාන කතා ප්‍රවෘත්තියට අමතරව පරිවාර කතා රාශියකි. සාහිත්‍යමය අගය අතින් සලකා බැලුවහොත් ඇතැම් පරිවාර කතා ප්‍රධාන කතාවට වඩා බෙහෙවින් උසස් ලෙස පිළිගත හැකිය. බොහෝ පරිවාර කතාවලින් හෙළිවන්නේ වේදේහ රජුගේ මෝඩකමින් මහෞෂධ පණ්ඩිතයන්ගේ බුද්ධි මහිමයන්ය.

උමංදාවෙන් වේදේහ රජුගේ චරිතයට මුල සිට අග දක්වා නිරූපණය කර ඇති ආකාරය සියුමට විමසා බැලීමේදී පෙනී යන කරුණක් නම් එය උසස් බටහිර නවකතාවක චරිතයට බොහෝදුරට සමාන වන බවයි.

උමංදාව පිළිබඳ වැඩි තොරතුරු ඉදිරි සාහිත්‍ය සම්භාෂණ සටහන් කිහිපයකින් විමසා බලමු.


RMA MOTORS
MECHANICAL REPAIRS FOR
ALL DIESEL/PETROL VEHICLES




RATNA
12A BUCH AVENUE
EPPING VIC 3076
PH: 03 9408 0005
FAX 0394080370
MOB 0425 867 048

ෆීජි කඩේ.. අපේ කඩේ..
Moonee Ponds
* Sri Lankan and Indian Spices and Groceries
* Frozen Fish and Frozen Indian food delicacies
* Sri Lankan Weekly News Papers
* Sinhala, Tamil and Indian Tele-dramas in VHS & Indian Movies in VCDs and DVDs
* Fresh Asian Vegetables
* Sri Lankan Take-away
* Ready to eat meal packs

සෑම බ්‍රහස්පතින්දාම
සිංහල එළවළු

JagathJE

We send Money to Sri Lanka
For all your Asian grocery needs.
Come and Talk to friendly staff
at our store.

INDIAN SRI LANKAN GROCERY SHOP
FIJI PRODUCTS
Shop 7/34 Aspen Street
Moonee Ponds 3039
Tel– 03-9370 3813